සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 52 | S | I |
|---|---|---|

## දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020
## Second Term Test - Grade 13 - 2020

විභාග අංකය .................................. **නර්තනය (දේශීය) I** කාලය පැය දෙකයි

වැදගත්

අංක 1 සිට 25 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ වඩාත් පිළිතුර තෝරා ඊට අදාල අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහනෙහි යොදන්න.

◈ **උපදෙස්: මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 100 කි.**

01. තං ජිං /// තක ජිං ගත කුද ගජිං .... මෙම බෙර පද කොටස,
1. ආවැන්දුම ආලාර්ති පදයේ ආරම්භයයි.
2. මගුල් බෙර වාදනයේ දේව පදයේ ආරම්භයයි.
3. යක් ඇන්නුම ආරම්භක පදයයි.
4. මගුල් බෙර වට්ටම් පිරීමේ පදයයි.
5. අස්නේ නැටුමෙහි ආරම්භක පදයයි. (........)

02. 'මම සිරස මුනීන්ද්‍රං ..........'' යන කවිය අයත් වන්නේ,
1. වරම් කවි වලට ය. 2. නමස්කාර කවි වලට ය. 3. සූවිසි විවරණ කවි වලටය.
4. කඩතුරා කවි වලට ය. 5. කිරි ඉතිරවීමේ කවි වලට ය. (........)

03. පහතරට මඩු ශාන්තිකර්ම වල කපු පත්තිනි සමාරෝපය වන්නේ,
1. රිද්දි බිසව් ලෙසය. 2. සූනියම් දේවිය ලෙසය.
3. දොවොල් දෙවි ලෙසය. 4. ගිරි දේවිය ලෙසය.
5. පත්තිනි දේවිය ලෙසය. (........)

04. රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයෙහි නැටුම් අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කර ඇත්තේ,
1. එස්.එල්.බී. කපුකොටුව මහතා
2. ඩබ්.බී. මකුලොලුව මහතා
3. නිමල් වෙල්ගම මහතා
4. එස්. පණීභාරත මහතා
5. චිත්‍රසේන ඩයස් මහතා (........)

05. වට්ටම් හතර ඇතුළත් කොහොඹා කංකාරියේ එන දීර්ඝ නර්තන අංගය ලෙස දැක්විය හැක්කේ,
1. අස්නේ නර්තන ය. 2. මඩුපුරය නර්තන ය. 3. යක්කැන්නුම නර්තන ය.
4. කොහොඹාහැල්ල නර්තන ය. 5. ආවැන්දුම නර්තන ය. (........)

06. මාරිසස් පෙටිපාගේ රංග රචනයෙනුත් චෙයිකොව්ස්කිගේ සංගීතයෙනුත් වර්ණවත් වූ නාට්‍ය ඇතුළත් වරණය වන්නේ,
1. හංසවිල, රෝමියෝ ජුලියට්, රන්ලොම් බැටළුවෝ
2. හංසවිල, නිදිකුමරිය, ද නට් කැකර්
3. හංසවිල, ද නට් කැකර්, රෝමියෝ ජුලියට්
4. හංසවිල, රෝමියෝ ජුලියට්, ලා සිල්ෆීඩ්
5. හංසවිල, රන්ලොම් බැටළුවෝ, නිදි කුමරිය (........)

07. දේශීය රංග භූමිය තුළ භාවිත ආලෝක ක්‍රම ශිල්ප ලෙස මුනින් අතට තබන ලද වංගෙඩියක් මත පොල්ලෙලි පහනක් දල්වනු ලබන්නේ,
1. සොකරි නාටකයේ ය.
2. පහන් මඩුවේ ය.
3. කෝලම් නාටකයේ ය.
4. සන්නියකුමේ ය.
5. වලියක් මංගල්‍යයේ ය. (........)

08. පහත සඳහන් වේදිකා සැරසිලි අතුරින් රංග කාර්යය සඳහා ඍජුවම සම්බන්ධ වන්නේ,
1. කොහොඹා කංකාරියේ අයිලය ය.
2. සන්නියකුමේ තුන්මළු පිදේනි ය.
3. කෝලම් රඟ මඩලෙහි වෙස් අත්ත ය.
4. රටයකුමේ උනුනු පියන ය.
5. බලි ශාන්ති කර්මයේ බලි මැස්ස ය. (........)

09. සිග්ෆ්‍රිඩ් කුමරු, ඔඩෙඩ් (Oddett) සහ වොන් රොද්බාට් (Von Rothbart) යන චරිත ඇතුළත් බැලේ නාට්‍යයක් වන්නේ,
1. නිදි කුමරිය ය.
2. ද නට් ක්‍රැකර් ය.
3. සින්ඩෙල්ලා ය.
4. හංසවිල ය.
5. රන්ලොම් බැටළුවෝ ය. (........)

10. අ.පො.ස. (උ.පෙළ) විෂය ධාරාවට නර්තනය විෂයයක් වශයෙන් ඇතුළත් කරන ලද්දේ,
1. වර්ෂ 1972 දී ය.
2. වර්ෂ 1943 දී ය.
3. වර්ෂ 1978 දී ය.
4. වර්ෂ 1934 දී ය.
5. වර්ෂ 1936 දී ය. (........)

11. තකුදං තක ජිජිකුද ගජි තකු තක ජිජිකුද...... යන පද කොටස මුදුන් කරමින් නර්තනය කරනු ලබන්නේ,
1. බුලත් පදයේ දී ය.
2. ආවැන්දුම දී ය.
3. අස්නේ නර්තනයේ දී ය.
4. කොහොඹාහැලේ දී ය.
5. යක්කැනුමේ දී ය. (........)

12. බැලේ (Ballet) නර්තනය සඳහා යොදාගන්නා ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන්නේ,
1. පියානෝවය.
2. වයලීනය ය.
3. චෙලෝ ය.
4. ගිටාරය ය.
5. වීණාව ය. (........)

13. මාත්‍රා 3 + 4 තාල රූපයට අයත් උඩරට අලංකාර බෙර පදයක් වන්නේ,
1. දෝං ජිං ජිං තකට දොංතක
2. දොංකඩ දොං ජිං තත් ජිං තත් ජිං තරිකිට
3. ජිං කඩතක ජිං කුකුතක
4. දොංගඩ ජිං ජිං ගත්තත් ජිං තත් ජිං ජිං කඩතක
5. දොංතකු දොං ජිං ජිං තත් තත් ජිං තත් තත් ජිං ජිං කඩතක (........)

14. බෝ කොට මඩුවක් බිම පේ කරතී - දෙවියන් යැදලා අවසර ගනිතී' මෙහි ලඝු අක්ෂර ගුරු අක්ෂර හා සදැස්මස් ගණන වන්නේ,
1. ලඝු අක්ෂර 22 ගුරු අක්ෂර 05 සැදැස්මස් 32
2. ලඝු අක්ෂර 18 ගුරු අක්ෂර 14 සැදැස්මස් 32
3. ලඝු අක්ෂර 05 ගුරු අක්ෂර 22 සැදැස්මස් 27
4. ලඝු අක්ෂර 18 ගුරු අක්ෂර 07 සැදැස්මස් 32
5. ලඝු අක්ෂර 16 ගුරු අක්ෂර 06 සැදැස්මස් 28 (........)

15. 'භරත සතෙහි පෙර ඉසිවර කී ලෙසට ..... මෙම කවි පදය ඇතුළත් වන්නේ,
1. කෝට්ටේ යුගයේ පරෙවි සංදේශයටය.
2. ගම්පල යුගයේ තිසර සංදේශයටය.
3. කොට්ටේ යුගයේ සැවුල් සංදේශයටය.
4. ගම්පල යුගයේ මයුර සංදේශයටය.
5. කෝට්ටේ යුගයේ පරෙවි සංදේශයටය. (........)

16. ලී කැටයමින් යුත් සිව්රූස් පනේලයේ නලඟන රුව දක්නට ලැබෙන්නේ,
1. ගම්පල යුගයේ ගඩලාදෙනිය විහාරයේ ය.
2. ගම්පල යුගයේ ඇම්බැක්කේ දේවාලයේ ය.
3. මහනුවර යුගයේ ලංකාතිලක විහාරයේ ය.
4. ගම්පල යුගයේ ගලපාත විහාරයේ ය.
5. පොළොන්නරු යුගයේ ශිව දේවාලයේ ය. (........)

17. ලොව ප්‍රථම එළිමහන් කවාකාර රංග භූමිය ලෙස හඳුන්වන්නේ,
1. ග්‍රීසියේ එපිඩෝර්ස් රඟහලය.
2. එදිරිවීර සරච්චන්ද්‍ර රඟහලය.
3. නෙළුම් පොකුණ රඟහලය.
4. මරදාන ටවර් රඟහලය.
5. ජෝන් ද සිල්වා රඟහලය. (........)

18. පහතරට නර්තන සම්ප්‍රදායේ එන රටයකුම ශාන්ති කර්මයේ දී පුද ලබන පිරිස අතරින් විශේෂ තැනක් හිමිවන්නේ,
1. පත්තිනි දේවියටය. 2. විෂ්ණු දෙවියන්ටය. 3. කොහොඹා දෙවියන්ටය.
4. වාහල දෙවියන්ටය. 5. රිද්දි බිසවුන්ටය. (........)

19. බැලේ නාට්‍යයන් අතරින් ලෝකයේ අතිශය ජනප්‍රියත්වයට පත් වූ බැලේ නාට්‍යයක් ලෙස සැලකෙන්නේ,
1. නිදි කුමරියය. 2. සින්ඩරෙල්ලාය. 3. හංසවිලය.
4. ද නට් ක්‍රැකර්ය. 5. රෝමියෝ ජුලියට්ය. (........)

20. වේදිකාවේ භාවිතා කළ හැකි රංගාලෝකය ප්‍රක්ෂේපණය කිරීමේ විදුලි පහන් හඳුන්වා දුන්නේ,
1. ගැලීලියෝ ගැලිලි විසිනි.
2. සර් ඇල්බට් අයින්ස්ටයින් විසිනි.
3. එංගලන්තයේ ඇඩොල්ෆා ඇපියා විසිනි.
4. එංගලන්තයේ ගෝර්ඩන් ක්රේග විසිනි.
5. සර් අයිසෙක් නිව්ටන් විසිනි. (........)

21. පූජා භාණ්ඩ හසුරුවමින් ඉදිරිපත් කරනු ලබන නර්තනාංගයකි.
1. මංගලම් නර්තනය. 2. මුසලඩි වන්නම නර්තනය. 3. ශුද්ධ මාත්‍රය නර්තනය.
4. ආවැන්දුම නර්තනය. 5. බුල්ත් පදය නර්තනය. (........)

22. ප්‍රථම වරට වෙස් බැඳි කාන්තාව ලෙස නර්තන ඉතිහාසටය එක් වී ඇත්තේ,
1. මිරැන්ඩා හේමලතා මහත්මියයි. 2. චන්ද්‍ර ලේඛා පෙරේරා මහත්මියයි.
3. වජිරා චිත්‍රසේන මහත්මියයි. 4. ශ්‍රීමති රසාදරී මහත්මියයි.
5. උපුලී පණීභාරත මහත්මියයි. (........)

23. මාත්‍රා 2 + 2 + 2 + 4 තාල රූපයට නර්තන කෙරෙන උඩරට වට්ටම් හතරට අයත්වන වට්ටම වන්නේ,
1. කුදංත ගත දොං වට්ටමය. 2. කුද කුජිගත වට්ටමය.
3. දොං ජිංත ගත දොංත වට්ටමය. 4. ගොග් ගොග් ජිං ජිංගත වට්ටමය.
5. ගුද ගති ගත වට්ටමය. (........)

24. මහනුවර යුගයේදී ලංකාවට පැමිණි ස්පීල් බර්ජන් මහතා විසින් ලියූ කෘතියක් ලෙස හැඳින්වේ.
1. විදේශීන් දුටු පුරාණ ලංකාව 2. එදා හෙළදිව
3. නෘත්‍ය රත්නාකරය 4. නාට්‍ය ශාස්ත්‍රය
5. අභිනය දර්පණය (........)

25. දොවොල් දෙවියන් ලක්දිවට පැමිණි නැවේ කුඹගස සිහිවීම පිණිස සිටවනු ලබන්නේ,
1. අත්පන්දමයි. 2. කාල පන්දමයි. 3. පොල්පන්දමයි.
4. විලක්තුවයි. 5. දෙකොන විලක්කුවයි. (........)

❖ **26 -35 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට අදාල පිළිතුරු යොදා සම්පූර්ණ කරන්න.**

26. කොහොඹා කංකාරියේ එන ඌරාගේ ගති ලක්ෂණ නිරූපණය වන අංග වික්ෂේප ඇතුලත් නර්තන අංගය .................................. වට්ටම යනුවෙන් හැඳින්වේ.

27. සන්කින් (SUNKING) යන අන්වර්ථ නාමයෙන් හඳුන්වන ලද බැලේ නර්තන කලාවට ඉමහත් සේවයක් ඉටුකළ අයෙකු ලෙස ................................................. නම් කළ හැකිය.

28. 'අඳිමින් සුදු පට සළු ගෙන සඳුනෙන් තුනු තවරා' මෙම කවිය කෝට්ටේ යුගයේ ලියවුණු ............................................. සංදේශයට අයත්වේ.

29. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පිහිටි .......................................... රඟ මඩල ග්‍රීක එළිමහන් රංග භූමි ආකෘතියට අනුව කරන ලද්දකි.

30. තුන්සුළු දෙමහා පස්තිතට අයත් ..................................... සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් නර්තනාංගයකි.

31. 1832 දී පැරිස් නගරයේදී පළමු වරට ඉදිරිපත් කළ ........................................ නාට්‍ය චමත්කාර ජනක බැලේ නාට්‍ය කලාවේ ආරම්භය ලෙස හැඳින්විය හැකිය.

32. සෑම වසරටකම අප්‍රේල් 29 දින ලෝක නර්තන දිනය ලෙස ප්‍රකාශ කරන ලද්දේ ................................ සංවිධානය මගිනි.

33. විලියම් ශේක්ෂ්පියර් විසින් නිර්මාණය කළ සුප්‍රකට .................................... රඟහල එලිසබීතන් රංග ශාලාවෙහි අග්‍රඵලය ලෙස හැඳින්වේ.

34. භරත නාට්‍යයම් හි එන .................................................... නර්තන අංගය නෘත, නෘත්‍ය, නාට්‍ය යන ලක්ෂණ ත්‍රිත්වයෙන්ම සමන්විත ය.

35. සංදර්ශනාත්මක ලක්ෂණ වලින් හෙබි නාට්‍ය විශේෂයක් වූ රෝම නාට්‍ය රඟ දැක්වීම සඳහා වේදිකා මණ්ඩප හා යොදා ගන්නා ලදී.

◈ **36-50 තෙක් ප්‍රශ්නවලට අදාල පිළිතුරු තිත් ඉරමත ලියන්න.**

36. නූතන වේදිකා ආලෝකනය සඳහා භාවිතා කරන ප්‍රධාන පහන් වර්ග දෙක නම් කරන්න.
1. ........................................................................ 2. ..........................................................................................

37. නිල් + කොළ හා කොළ + රතු යන මූලික ආලෝක වර්ණ එකතුව සෑදෙන මූලික වර්ණ දෙක නම් කරන්න.
1. ........................................................................ 2. ..........................................................................................

38. ශුද්ධ මාත්‍රය සහ මුල් මාත්‍රය ඇතුලත් නර්තන සම්ප්‍රදායන් නම් කරන්න.
1. ........................................................................ 2. ..........................................................................................

39. මගුල් බෙර වාදනයේදී දේව පදයෙන් අනතුරුව වාදනය කරන පද වර්ග දෙක නම් කරන්න.
1. ........................................................................ 2. ..........................................................................................

40. ලංකාවේ බිහි වූ ප්‍රථම ප්‍රොඩීනියම් ආරුක්කු වේදිකාව සහ එය බිහි වූ වර්ෂය නම් කරන්න.
1. ........................................................................ 2. ..........................................................................................

41. යූ.වී. ලයිට් (Ultra Violet Lamp) වලින් විහිදුවන ආලෝකයට ප්‍රතිචාර දක්වන වර්ණය හා ආලෝකයේ තීව්‍රතාව පාලනය කරන උපකරණය නම් කරන්න.
1. වර්ණය ............................................................. 2. තීව්‍රතාවය ..................................................................................

42. 'තහලම් කළ බෙර තම්මැට පට තන්තිරි ඩමරු' යන කවිය අයත් සංදේශ හා යුගය නම් කරන්න.
1. සංදේශය ..................................................................... 2. යුගය .........................................................................

- **43 සහ 44 ප්‍රශ්න සඳහා පහත රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.**



A



B



C

43. A හා B රූපයෙන් දැක්වෙන බැලේ නාට්‍ය දෙක නම් කරන්න.

1. A ............................................................. 2. B .............................................................................

44. C රූපයේ දැක්වෙන බැලේ නාට්‍ය සඳහා සංගීතය හා නර්තන නිර්මාණයෙන් දායක වූ ශිල්පීන් නම් කරන්න.

1. සංගීත නිර්මාණය ............................................. 2. නර්තන නිර්මාණය ......................................................

45. 1936 දී ආරම්භ වූ සභාව හා 1972 දී ආරම්භ වූ විද්‍යාලය නම් කරන්න.

1. 1936 ............................................................... 2. 1975 .............................................................................

46. සිංහල ගැමි නාටකය හා සිංහල සැරසිලි කලාව යන කෘති රචනා කරන ලද්දේ කවුරුන් විසින්ද?

1. සිංහල ගැමි නාටකය ......................................................

2. සිංහල සැරසිලි කලාව ......................................................................

47. සෞන්දර්ය අධ්‍යයන ආයතනය ස්වාධීන විශ්වවිද්‍යාලයක් බවට පත්වූ වර්ෂය හා එම විශ්වවිද්‍යාලයේ නම සඳහන් කරන්න.

1. වර්ෂය ...................................................................

2. විශ්වවිද්‍යාලය ...................................................................

48. අත්‍යාබෙර සහ පුරප්පට්ටු වාදනය සිදු කරනු ලබන භාණ්ඩ දෙක නම් කරන්න.

1. ....................................................... 2. ..........................................................................

49. 'ශාප් මෝචන්' හා චිත්‍රාංගදා නිර්මාණය කළ ශිල්පියා සහ ඒ සඳහා පසුබිම් වූ නර්තන සම්ප්‍රදාය නම් කරන්න.

1. නර්තන අංගය .......................................... 2. සම්ප්‍රදාය ......................................................................

50. සන්නියකුමේ මරුවා වේදිකාවට ප්‍රවේශවීමේදී ප්‍රේක්ෂකයා තුළ ජනිත වන භාවය හා රසය නම් කරන්න.

1. භාවය .................................................... 2. රසය ....................................................................

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

52 S II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

Second Term Test - Grade 13 - 2020

විභාග අංකය .................................. නර්තනය (දේශීය) II කාලය පැය තුනයි

වැදගත්

පළමුවන කොටසේ ප්‍රශ්න 01 හා 02 අනිවාර්ය වේ. II හා III, යන කොටස්වලින් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

සෑම ප්‍රශ්නයකටම (I) කොටසට ලකුණු 06 ක් ද, (II) කොටසට ලකුණු 06 ක් ද, (III) කොටසට ලකුණු 08 ක් ද වශයෙන් මුළු ලකුණු 20 ක් හිමි වේ.

## I කොටස

01. i. පහත සඳහන් බෙර පදය මාත්‍රා 2 +4 තාල රූපයට ප්‍රස්තාර කරන්න.
කුංදඩ කුං ජිං තරිකිට ජිංතක ජිංතක තරිකිට

ii. පහත සඳහන් කවි පද මාත්‍රා 3 තාල රූපයට ප්‍රස්තාර කරන්න.
රන්විල රිද්දි විල කෙළිනා බිසවුන්ට
මැණික් ගඟේ දිය නාලා ගොඩ වෙන්ට

iii. ගොග් ගොග් ජිං ජිංගත වට්ටමේ දෙවන අඩව්ව අදාළ තාල රූපයට ප්‍රස්තාර කරන්න.

02. පුරාවිද්‍යාත්මක හා ලිඛිත සාධක ඇසුරෙන් දේශීය නර්තන කලා ඉතිහාසය අධ්‍යයනය කළ හැකිය.

i. සන්දේශ කාව්‍යය දෙකක් ඇසුරෙන් කෝට්ටේ යුගයේ නර්තන කලාව පිළිබඳ සාදක දෙකක් ඉදිරිපත් කරන්න.

ii. මහනුවර හා ගම්පොළ යුගවල නර්තන කලාව පැවති තත්වය පිළිබඳ දේශසංචාරක වාර්තා දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.

iii. 1930 දශකය හා 1940 දශකය නර්තන කලාව විවිධ පැතිකඩ ඔස්සේ ප්‍රවර්ධනය වූ ආකාරය සාදක 04 ක් ඔස්සේ දක්වන්න.

## II කොටස

03. රංගභූමි අලංකරණය තුළින් දේශීය ශාන්ති කර්මයන්හි විචිත්‍රත්වය වඩාත් ඔප් නැංවී ඇත.

i. කොහොඹා කංකාරියේ එන රංග භූමි සැරසිලි දෙකක් ඇසුරින් ඉහත කියමන විස්තර කරන්න.

ii. රටයකුම ශාන්තිකර්මයේ නානුමුරය පෙළපාලිය තුළ රංග භාණ්ඩ භාවිතය නිරූපණ කාර්යයට දායක වී ඇති අයුරු පැහැදිලි කරන්න.

iii. බලි ශාන්ති කර්මයෙහි දක්නට ලැබෙන ඇඹුම් ශිල්ප ක්‍රම වර්ණ ගැන්වීම, සැරසිලි හා අමුද්‍රව්‍යවල සුවිශේෂත්වය පිළිබඳ විග්‍රහයක් කරන්න.

04. දේශීය ශාන්තිකර්මවල මඩු භූමි සකස් කිරීමේදී මෙන්ම මඩු භූමිය තුල පැවතිය යුතු ආකාරය පිළිබඳව ද සම්මතයන් පවතී.

i. ශාන්ති කර්ම රඟමඩල හඳුන්වන්න.

ii. ශාන්ති කර්ම රඟමඩල සකස් කිරීමේ සම්මතයන් පිළිබඳ කොහොඹා කංකාරි මඩුපුරේ ගායනා ඇසුරින් පැහැදිලි කරන්න.

iii. යක්දෙස්සන් රඟමඩල තුල පැවතිය යුතු පිලිවෙත් පිළිබඳ දක්වා නියමයන් හා ආචාර ධර්ම පිළිබඳ උදාහරණ දක්වමින් විමසුමක් කරන්න.

05. ප්‍රාසාංගික බව වර්ධනයෙහිලා රංග භූමිය අලංකරණය සහ රංග වින්‍යාසය වැදගත් තැනක් උසුලයි.

i. සොකරි රඟ මඬල විස්තර කරන්න.

ii. ගැමි නැටුම්වල ප්‍රාසාංගික බව වර්ධනයෙහිලා රංග වින්‍යාසය ඉවහල් කර ගත හැකි ආකාරය පිළිබඳ අදහස් දක්වන්න.

iii. කෝලම් රංග කාර්යය සඳහා රඟ මඬල තුළ භාවිත වන ශිල්ප ක්‍රම පිළිබඳ විමසුමක් කරන්න.

## **III කොටස**

06.

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| උයද ශංකර් | නල දමයන්ති | මකුට |
| ජෝන් ජෝර්ජ් නෝර්වේ | ශාප් මෝචන් | ඝෙඃරි |
| රුක්මනීදේවී අරුන්ඩේල් | නට් ක්‍රැකර් | ලෙහෙඟා |
| රවීන්ද්‍රනාත් තාගෝර් | කරදිය | ස්කලේෆෝ |

i. (අ) කොටස බැලේ නාට්‍යය ප්‍රවර්ධනයට කැපවූ ශිල්පියා නම්කර ඔහුගේ දායකත්වය පිළිබඳ ඇගයීමක් කරන්න.

ii. ආ - කොටස අවුරෝරා කුමරිය හා සම්බන්ධ බැලේ රංගය නම්කොට එහි කථා තේමාව ලියා දක්වන්න.

iii. ඉ - කොටස බැලේ රංගවස්ත්‍රාභරණවලට අයත් කොටසක් තෝරා එය චලනවල ස්වභාවය මතුකර දැක්විම සඳහා ඉවහල් වන අයුරු පැහැදිලි කරන්න.

07. නර්තන අංගයක් නිර්මාණාත්මකව ඉදිරිපත් කිරීමේදී රංග ආලෝකය වැදගත් ස්ථානයක් ගනී.

i. නූතන වේදිකාවේ භාවිතාවන ප්‍රධාන ලාම්පු වර්ග දෙකක් නම් කර හඳුන්වන්න.

ii. 'වේදිකා ආලෝකකරණයේදී එම ප්‍රසංග අංකය සඳහා භාවිතා වන රංග වස්ත්‍ර පිළිබඳ මනා අවබෝධයක් ආලෝක ශිල්පියා සතු විය යුතුය. මෙය පහදන්න.

iii. ශාන්තිකර්ම වල පරිහරණය කළ පන්දම් ආලෝකයේ සිට නූතන ආලෝක තත්වයන් තෙක් පරිණාමය වී ඇති ආකාරය විමසන්න.

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
දෙවන වාර පරීක්ෂණය - 2020

| **13 ශ්‍රේණිය** | **නර්තනය I** | **පිළිතුරු පත්‍රය** |
|---|---|---|

## I කොටස

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | 2 | 11. | 2 | 21. | 5 |
| 2. | 2 | 12. | 1 | 22. | 2 |
| 3. | 5 | 13. | 5 | 23. | 4 |
| 4. | 4 | 14. | 4 | 24. | 1 |
| 5. | 5 | 15. | 3 | 25. | 2 |
| 6. | 2 | 16. | 2 | 26. | දොංගර ජිං ජිං ගජිගත වට්ටම |
| 7. | 1 | 17. | 1 | 27. | 14 වන ලුවී රජත |
| 8. | 3 | 18. | 5 | 28. | කෝකිල සංදේශය |
| 9. | 4 | 19. | 3 | 29. | එදිරිවීර සරච්චන්ද්‍ර එළිමහන් රඟහල (රංග පීඨය) |
| 10. | 3 | 20. | 4 | 30. | මුල්මාත්‍රය |

31. ලා සිල් ගීඩ් 32. යුනෙස්කෝ 33. ග්ලෝබ් (Globe)

34. වර්ණම් 35. සන්දර්ශන කරත්ත 36. තිත් පහන් (යොමු පහන් 2. ධාරා පහන්

37. 1. මොනර නිල 2. මැජන්ටා

38. 1. පහතරට නර්තන සම්ප්‍රදාය 2. සබරගමු නර්තන සම්ප්‍රදාය 39. 1. ආශිර්වාද පදය 2. ගුරු පදය

40. වේදිකාය - ටවර් රඟහල (මරදාන) 2. වර්ෂය - 1911 41. 1. සුදුපාට 2. ආලෝක තීව්‍රතා පාලකය (Dimmer)

42. 1. සංදේශය - තිසර 2. යුගය - ගම්පොළ 43. 1. A හංස විල 2. B ද නට් කැකර්

44. 1. සංගීත නිර්මාණය - චෙකොස්කි 2. නර්තන නිර්මාණය - මාරියස් පෙටිපා

45. 1. 1936 - ගාන්ධර්ව සභාව 2. 1972 - හිරාගම සෞන්දර්ය ගුරු විදුහල


46. 1. සිංහල ගැමි නාටකය - මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා
   2. සිංහල සැරසිලි කලාව - මහාචාර්ය ලයනල් බෙන්තරගේ මහතා

47. 1. වර්ෂය - 2005 2. නම - සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

48. 1. ගැටබෙරය 2. තම්මැට්ටම 49. 1. රවීන්ද්‍රනාත් තාගෝර් 2. මණිපුරි නර්තන සම්ප්‍රදාය

50. 1. භාවය - භය 2. රසය - භායනක

## II පත්‍රය - I කොටස


(01)
(I)

| 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කුං | දිඹ | කුං | ජිං | තරි | කිට | ජිං | තක | ජිං | තක | තරි | කිට |

(II)

| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | රෝ | විල | රිද් | - | දි | + | විල | කෙ | ළි | නා | - |
| + | බිස | වුන් | - | ට | - | - | - | - | - | - | - |
| + | මැ | සිත් | ව් | ලේ | - | + | දිය | නා | - | ලා | - |
| + | ගොඹ | මෙන් | - | ට | - | - | - | - | - | - | - |

| 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|
| ජේ | තිං | ත | කු | ත | ක | ජි | ජි | කු | ද |
| කඩ | තක | තරි | කට | තං | - | ජිත් | - | තම් | - |
| ගත් | - | ජිත් | - | ත | ත | ජි | ජි | කු | ද |
| ග | ජිත් | - | කු | දත් | - | දොං | - | - | - |
| ජිඹ | ඩඩ | කු | ද | ග | ත | කු | ද | කු | ද |
| ගත් | - | තෙ | තිං | ජිත් | - | තෙ | තිං | තෙ | තිං |
| දෙරණ | කඩ | තත | කඩ | ත | ක | දො | මි | නි | ට |
| ග | ත | දොදු | - | දොං | - | තා | - | - | - |
| ගත් | - | තු | කු | ජිත් | - | තා | - | - | - |
| ග | ජි | ත | කු | ජිත් | - | තා | - | - | - |
| ග | ත | තො | තො | තු | ක | දො | මි | නි | ට |
| දොං | ගඩ | තරි | කට | ජිත් | - | තා. | | | |

02. (i) සැලලිහිණිය පරවිය කෝකිල, සැවුල්, හංස ආදී සංදේශ කාව්‍යයන් තුළින් උදාහරණ 02 ක් දක්වා ඇත්නම් ..... (ල. 06)

(ii) 14 වන සියවසේ ලංකාවට පැමිණි දේශසංචාරකයෙකු වන ඉබන් බතුතා විදේශීන් දුටු පුරාණ ලංකාව නැමති කෘතියෙහි සඳහන් කොට ඇති වාර්තාව සහ ඉංග්‍රීසි ජාතික රොබට් නොක්ස්ගේ එදා හෙළ දිව ග්‍රන්ථයෙහි සඳහන් වාර්තාව හෝ ස්පීල් බර්ජන්ගේ විදේශීන් දුටු පුරාණ ලංකාව නැමති ග්‍රන්ථයෙහි ඇතුළත් මහනුවර පෙරහැර පිළිබඳ වාර්තාව
සාදක දෙකක් ඇසුරෙන් විස්තර කර ඇත්නම් (ල. 06)

(iii) තිහේ දශකයේ චන්ද්‍රලේඛා මහත්මිය නර්තනයට පිවිසීම
1934 - රවීන්ද්‍රනාත් තාගෝර් තුමාගේ පැමිණීම
1936 - ගාන්ධර්ව විභාගය ආරම්භ කිරීම
හතලියේ දශකයේ මුද්‍රනාට්‍ය ආරම්භ වීම.
1943 - අධ්‍යාපන විෂයක් ලෙස නර්තන විෂයේ මූලාරම්භය ඇතිවීම.
1945 - ප්‍රථම වතාවට නර්තන විෂය සඳහා පරීක්ෂකයවරයෙකු පත් කිරීම... ආදී සාදක 04 ක් ඔස්සේ දක්වා ඇත්නම්

(ලකුණු 8) (මුළු ලකුණු 20)

03. (i) කොහොඹා කංකාරියට අයත් රංග භූමි සැරසිලි දෙයක් නම් කර තිබීම. (යහන, අයිලය, මල්පැල) (ලකුණු 2යි)
එම සැරසිලි සඳහා කෙසෙල් බඩ, කෙසෙල් පතුරු, ගොක්කොළ භාවිත කරන බව
ස්වාභාවික ද්‍රව්‍ය කැටයම් කිරීම, වර්ණ ගැලපීම මගින් අලංකාරව සකස් කර ගන්නා බව
එම අලංකරණ තුළින් ශාන්ති කර්ම මඩුවට විචිත්‍රත්වයක් ලැබෙන ආකාරය විස්තර කර තිබීම. (ල.04)

(ii) නානුමුරයේ ප්‍රධාන රංග උපකරණ ඇතුළත් වට්ටිය නානුමුර වට්ටිය හෙවත් උනනු පියන ලෙස නම් කරන බව
නානුමරයේ දොළහ පෙළපාළියටම අදාළව රංග උපකරණ ස්වභාවික අමු ද්‍රව්‍ය භාවිතයෙන් අලංකාරව සකස් කරගෙන ඇති බව.
එක් එක් පෙළපාලියේ දී ගායනා සමඟ තාලානුකූලව කරනු ලබන නිරූපණ කාර්යයේදී එම උපකරණ භාවිත කරන අයුරු පැහැදිලි කර තිබීම. (ලකුණු 6)

(iii) ඇඹුම් ශිල්ප ක්‍රම
උතුරින් ඇති තුඹසකින් හුඹස් මැටි ගන්නා බව
සඳුන් කිරි පැන් ඉස මැටි පේ කරගන්නා බව
නේත්‍රා තැබීම සිදු කරන බව
වර්ණ ගැන්වීම

පොල්කටු අඟුරු, ගුරු ගල්, කොළ යුෂ, කිරිමැටි, කහ කුඩු, නිල් කුඩු වැනි ස්වභාවික ද්‍රව්‍යවලින් සකස් කර ගන්නා ද්‍රව්‍ය භාවිතා කරන බව
සැරසිලි අමුද්‍රව්‍ය
බලි මඩුව හා මැස්ස තැනීම
අට මඟල තැනීම
මල් බුලත් පුටුව සැකසීම
කෙසෙල් පතුරු, හබරළ කොළ, ගොක්කොළ වර්ණවත් මල් වර්ග .... භාවිත කරන බව
(මුළු ලකුණු 20)

## II කොටස

04. (i) ශාන්තිකර්ම රඟමඩල සඳහා පොදු භූමියක් හෝ ආතුරයාගේ ගෙමිදුල යොදාගත් බව
ශාන්තිකර්ම අපේක්ෂාණ මත ඉදිකරන මෙම රඟ මඩල මඩුව නමින් ද හැඳින්වෙන බව
නර්තන සම්ප්‍රදායන් තුනේම ශාන්තිකර්ම රඟ දැක්වීම සඳහා මඩුව යොදාගත් බව
ආදී ලෙස ගැලපෙන කරුණු දැක්වීමට (ල. 06)

(ii) ශාන්තිකර්ම භූමි සකස් කිරීම පිළිබඳ ඇති සම්මත කවි ඇසුරින් කරුණු දක්වා ඇත්නම්,
උදා:- 'දිගින් මඩුව සැටරියනයි'
'දිගින් සැට රියනේ - පුළුලින් එතිස් රියනේ'
'රජ කුලයට සැට රියනයි'
'බෝදිලි තැඹිලි තල් පොල් මල් පුවක් වලු - ඒ ඒ තැනින් රඹ තැන් සමඟ ඉඳිවලු
යන කවි දක්වා විස්තර කර ඇත්නම් (ලකුණු 6)

(iii) යක්දෙස්සන් පැවතිය යුතු ආකාරය දක්වා ඇති කවි ලියා දැක්වීම.
උදා:- මෙම කාර්යයට නුසුදුසු අය පිළිබඳ දක්වා ඇති කවිය
'අතපය බරවා කොර බිහිරෝ ඇත'
යක්දෙනිකමට සුදුසු අය ලෙස
' රූබර ගුණ වඩමින් බර රැදෙනා'
ඇත යක්දෙනි තොප - කිවේවොත් මෙරඟ වැඩලප
සිතතොත් පහද තොප - තොලවු රඟ මඩුවේ බුලත් හප
ආදී ලෙස උදාහරණ දක්වා ඇත්නම් (ලකුණු 8)

05. (i) කමත රංග භූමිය ලෙස යොදාගන්නා බව
අතීතයේ කවාකාර රංගභූමිය මැද ගෙඩි සහිත අඹ අත්තක් සිටුවයි.
මුනින් අතට තබන ලද වංගෙඩියක් මත පොල්තෙල් පහනක් දල්වන බව
සොකරි රඟමඩලේ පසෙකින් වියන ලද ගොක් අත්තකින් ආවරණයක් සකස් කරන බව සමහරු එය මල්පැළ ලෙස හඳුන්න බව.
මැටිපහනක් හෝ පැපොල් පලුවක් පහනක් ලෙස භාවිතා කරන බව. (ලකුණු 6)

(ii) රංග වින්‍යාසයේදී අවකාශ භාවිතාය පිළිබඳ සංකලප් වැදගත් වන බව උදා:- දිසා, තල, රටා, මෝස්තර හැඩලත සම්බන්ධතා)
මෙම මූලික සංකල්ප පිළිබඳ මනා අවබෝධයකින් යුක්තව නිර්මාණය කිරිම මගින් සාමූහිකව නර්තන අංගයන් ලෙස ගැමි නර්තනයන්හි ප්‍රාසාංගික බව වර්ධනය වන ආකාරය විස්තර කර තිබම. (ලකුණු 6)

(iii) කෝලම් රඟ මඩල විස්තර කර තිබීම.
වෙස් අත්තම පිටුපසින් නේසත්‍යාගාරය සකස් කර ඇති බව
වෙස් අත්ත චරිත ප්‍රවේශයට මෙන්ම භාවිතා කරන බව
වෙස් අත්තට මුවා වී උසුළු විසුළු කරන ආකාරය
මල් යහන දෙපස ගායන වාදන වෘන්දය අසුන් ගන්නා බව ආදිය විස්තර කර තිබීම.
(ලකුණු 8) (මුළු ලකුණු 20)

06. (i) ජීන් ජෝර්ජ් නොර්වැර්
නොර්වැර් 1727 අප්‍රේල් 29 දින පැරීසියේ උපන් අතර ප්‍රවීණග නර්තන ශිල්පියා වූ බව
1761 ත්‍රී රෝයල් බැලේ නාට්‍ය කණ්ඩායමට එක් වූ බව
බැලේ නාට්‍ය නවීකරණය කර ශිල්පියා මට්ටමට ගෙන ආ බව
ඔහු විසින් රචිත Leters on Dancing and Ballet යන කෘතියෙන් ශාරීරික චලන හා ප්‍රකාශ කිරීමේ කලාව පිළිබඳ කරුණු දක්වා ඇති බව.
නට් ක්‍රැකර්, රොමොන්ඩා, රෝමියෝ ජුලියට් නම් බැලේ නිෂ්පාදනය කර ඇතිබව
බැලේ නර්තනයේ මුත්තා යන විරුදාවලියෙන් හඳුන්වන බව
ආදී වශයෙන් කරුණු හයක්වත් ලියා ඇත්නම් (ලකුණු 6)

(ii) නට් ක්‍රැකර්
නම් කිරිමට (ල. 02) නළු තේමාව ලියා දැක්වීමට (ල. 4) (ල. 06)

(iii) ස්කල්පෙ - නම් කිරීමට (ල. 02)

සංචලන පිළිබඳ විස්තර කර තිබීම උදාඃ- ඇඟිලි තුඩුවලින් ඇවිදීම, කැරකීම, පැණීම් ක්‍රම ආදී වශයෙන් විස්තර කර තිබීම. (ලකුණු 6) (ලකුණු 8)

07. (i) ලාම්පු වර්ග දෙකක් නිවැරදිව නම් කිරීම (ලකුණු 2)
ලාම්පු වර්ග දෙක හඳුන්වා කෙටි විස්තරයක් කර තිබීම (ල. 04) (ල.06)

(ii) තත් වර්ණ හා ආලෝක වර්ණයන්හි මූලික වර්ණ සහ ද්විතීයික වර්ණ එකිනෙනෙක වෙනස් බව
රංග වස්ත්‍රාභරණවල ඇති ද්‍රව්‍ය වර්ණවල වර්ණ නොවෙනස්වන අයුරින් අලෝක වර්ණ භාවිතා කළ යුතු බව
රංග වස්ත්‍ර සැකසීම සඳහා යොදාගෙන ඇති රෙදි වර්ග පිළිබඳ අවබෝධයක් තිබිය යුතු බව
ද්‍රව්‍ය වර්ණ පිළිබඳ ඇති අවබෝධය මත අවස්ථානුකූලව රංග වස්ත්‍රවල වර්ණ වෙනස් කර ගැනීමෙන් නිර්මාණය කාර්යය පහසු කර ගත හැකි බව ආදී කරුණු දක්වා පැහැදිලි කර තිබීම. (ලකුණු 6)

(iii) ප්‍රාථමික මිනිසා ස්වකීය රංගනයන් දක්වන ලද්දේ ගිනි මැල දල්වා ගෙනය. රාත්‍රී කාලයේ පවත්වන ජන නාටක හා ශාන්තිකර්ම භාවිතා කරන විට ගින්නෙහි ආලෝකය විවිධ ක්‍රම මගින් භාවිතා කර ඇති බව. (උදාඃ- පොල් පන්දම්, අත් පන්දම්, තාල පන්දම්, විලක්කු, තෙල් පහන්)
ඉන්පසු ලන්තෑරුම්, පැට්‍රොල් මැක්ස් ලාම්පුවලින් ආලෝකය ලබාගත් බව
18 වන සියවසේ ඇති වූ තාක්ෂණික දියුණුව සමඟ ඉටිපන්දම් ආලෝකය, ගෑස් ආලෝකය සොයා ගැනීමත් 19 වන සියවසේ ප්‍රාසාංගික කලාවන් සමඟ සම්මිශ්‍ර වූ බව
ස්විට්සර් ලන්තයේ ඇඩොල්ෆා ඇපියා, එංගලන්තයේ ගෝර්ඩන් කේවේරා රංගලෝකයේ විදුලි ලාම්පු හඳුන්වා දීමේ පුරෝගාමීන 'බව ක්‍රි.ව. 1900 - 1914 කාලය තුල කල පර්යේෂණවල ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ භාවිතායට ගන්නා විදුලි ලාම්පු වර්ග රඟහල්වලට එක් වූ බව වර්තමානයේ භාවිතයට ගන්නා විදුලි ලාම්පු වර්ග රගහල්වලට එක් බව. (ල 08)